din-938P-27x4-pnf

# ලංසු සඳහා ආරාධනයයි (IFB)

# බන්ධනාගාර දෙපාර්තමේන්තුව

## වැලිකඩ පරිශ්‍රය සඳහා තාවකාලික බැරැක්ක ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීම - 2026

### කොන්ත්‍රාත් අංකය : Pri/Eng/Officers Barrack/2104/2026

01. බන්ධනාගාර මූලස්ථානය වෙනුවෙන් දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, වැලිකඩ පරිශ්‍රය සඳහා තාවකාලික බැරැක්ක ගොඩනැගිලි සැලසුම් කිරීම සහ ඉදිකිරීම - 2026 සඳහා යෝග්‍යතාපූර්ණ සහ සුදුසුකම් ලත් ලංසුකරුවන් වෙතින් මුද්‍ර, තබන ලද ලංසු මෙයින් කැඳවනු ලැබේ. ඇස්තමේන්තුගත ඉදිකිරීම් පිරිවැය ආසන්න වශයෙන් රුපියල් මිලියන 44.9 කි. සැලසුම් කිරීමේ සහ ඉදිකිරීමේ කාලය දින 60 කි.

02. ජාතික තරගකාරී ලංසුකරණ පටිපාටිය මගින් ලංසුකරණය මෙහෙයැවේ.

03. කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම සඳහා සුදුසුකම් ලැබීමට: සාර්ථක ලංසුකරු අසාදු ලේඛනගත කර නොතිබිය යුතු අතර, පහත අවශ්‍යතා සපුරාලිය යුතුය.

   i. ගොඩනැගිලි ඉදිකිරීම් යටතේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ (CIDA) (C4, C5 සහ C6) ලියාපදිංචි වී තිබිය යුතු අතර, අදාළ යෝජිත ඉදිකිරීම් ක්‍රමවේදයන් යටතේ සැලකිය යුතු ලෙස නිම කරන ලද එක් ව්‍යාපෘතියක හෝ පළපුරුද්දක් තිබිය යුතු අතර, ලංසු ඇගයීම් කාලය තුළ වලංගු ලියාපදිංචියක් තිබිය යුතුය.

   ii. යෝජිත ගොඩනැගිලි පද්ධතිය සඳහා මොඩියුලර් (modular), පෙරනිමි (prefabricated), පැනලකරණය වූ (panelized), ඩියුරා ගොඩනැගිලි පද්ධති (Durra building systems), පරිමාමිතික මොඩියුලර් (volumetric modular) හෝ වෙනත් සමාන නව්‍ය ඉදිකිරීම් තාක්ෂණයන් ඇතුළත් වීම වඩාත් සුදුසු වේ.

   iii. අදාළ වන පරිදි 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ විධිවිධානවලට අනුකූල වීම අවශ්‍ය වේ.

   iv. සියලුම ලංසුකරුවන් තම ලංසු සමග දූෂසන්ධානය නොවීමේ ප්‍රකාශනය ඉදිරිපත් කළ යුතුය.

04. ලංසු 2026-09-08 සිට 2026-12-11 දක්වා වලංගු විය යුතුය.

05. සියලුම ලංසු සමග රුපියල් 450,000.00 ක වටිනාකමකින් යුත් කොන්දේසි විරහිත ලංසු ඇපයක් ඉදිරිපත් කළ යුතුය. මෙම ඇපය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කරන ලද, ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවක් විසින් නිකුත් කරන ලද බැංකු ඇපකරයක් ආකාරයෙන් විය යුතු අතර, එය පළමු ඉල්ලීමේදීම මුදල් කළ හැකි පරිදි, බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයාගේ නමට ලියා තිබිය යුතුය. ලංසු ඇපකරය 2026-09-08 සිට 2027-01-08 දක්වා වලංගු විය යුතුය.

06. පූර්ව ලංසු රැස්වීම 2026-08-25 දින පෙ.ව. 10.00 ට බන්ධනාගාර මූලස්ථාන ශ්‍රවණාගාරයේදී පැවැත්වෙන අතර, ඉන් අනතුරුව අදාළ ස්ථානයේ නිරීක්ෂණ චාරිකාවක් සිදු කෙරේ.

07. ලංසු භාරදීමේ අවසන් දිනය සහ වේලාව 2026-09-08 දින 14.00 පැය වේ.

08. ලංසු ලේඛන නොමිලේ පරීක්ෂා කළ හැකි අතර, වැඩිදුර තොරතුරු අංක 150, බේස්ලයින් පාර, කොළඹ 09 ලිපිනයේ පිහිටි බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයෙන් ලබා ගත හැක.

09. නැවත නොගෙවන ටෙන්ඩර් ගාස්තුව රු. 10,000.00 ක් ගෙවීමෙන් අනතුරුව 2026-08-18 සිට 2026-09-07 දින ප.ව. 2.00 දක්වා කොළඹ 09 , බේස්ලයින් පාර, අංක 150, බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ ඉංජිනේරු අංශයේ අධ්‍යක්ෂක ඉංජිනේරු වෙතින් ලංසුකරුවන්ට, ඉංග්‍රීසි භාෂාවෙන් සැකසී ඇති ලංසු ලිපිලේඛන සම්පූර්ණ කට්ටලයක් ලබා ගත හැක.

10. මුද්‍ර, තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ අංක 150, බේස්ලයින් පාර, කොළඹ 09 ලිපිනයේ පිහිටි බන්ධනාගාර මූලස්ථානයේ ඉංජිනේරු අංශයේ අධ්‍යක්ෂ කාර්යාලයේ අදාළ ටෙන්ඩර් පෙට්ටියට අතින් ගෙනවිත් භාරදීමෙන් අවසන් දිනට පෙර ලැබෙන සේ එවිය යුතුය.

11. ලංසු මුල් පිටපත සහ අනු පිටපත සහිතව සභාපති, ප්‍රසම්පාදන කමිටුව, මූලස්ථානය, අංක 150, බේස්ලයින් පාර, කොළඹ 09 යන ලිපිනයට 2026-09-08 දින 14.00 පැය ට හෝ ඊට පෙර ගෙනවිත් භාර දිය යුතුය. ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබේ. ලංසු භාරගැනීම අවසන් වූ වහාම එම අවස්ථාවට සහභාගී වීම සඳහා කැමැත්තක් දක්වන ලංසුකරුවන්ගේ හෝ ලංසුකරුගෙන් බලයලත් ලිපියක් සහිත නියෝජිතයෙකුගේ ඉදිරිපිටදී ලංසු විවෘත කරනු ලැබේ.

12. උනන්දුවක් දක්වන ලංසුකරුවන්ට ඉංජිනේරු අංශය, බන්ධනාගාර මූලස්ථානය, අංක 150, බේස්ලයින් පාර, කොළඹ 09 වෙතින් වැඩිදුර තොරතුරු ලබා ගත හැක. (0114677126 – අධ්‍යක්ෂ ඉංජිනේරු).

13. දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (DPC) විසින් ගනු ලබන තීරණය ප්‍රසම්පාදනයේ අවසාන තීරණය ලෙස සැලකේ.

**සභාපති, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,**
**බන්ධනාගාර මූලස්ථානය,**
**අංක 150, බේස්ලයින් පාර, කොළඹ 09.**

**2026.08.18**